# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,588 — 1965 දෙසැම්බර් 17 වැනි සිකුරාද — 1965.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ප්‍රකාශන ආදිය

අ. ආ. කා. අංක එන් 111/65

**ශ්‍රී ලංකාද්වීපයේ හා තදීය යටත් දේශයන්ගේ අග්‍රාණ්ඩුකාර හා සේනාධිනායක ධූරීන,**
**බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අති උත්තම පටිපාටියෙහි සාමාජිකයකුවූ**
**විලියම් ගොපල්ලව උතුමාණන් වහන්සේ විසිනි.**

මුද්‍රාව

ඩබ්ලිව්. ගොපල්ලව.

නිල ඒනියාස් ද සිල්වා විජේසේකර මහත්මයා වෙත ය.

ශුභාශිංසන පෙරටුවයි :

මෙහි මින් මතු සඳහන් කාර්යයන් සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍ය යයි මට පෙනී යන හෙයින්,

අග්‍රාණ්ඩුකාර ධුරන්ධර, විලියම් ගොපල්ලව, වන මම, ඔබේ විචක්ෂණ භාවය, සාමාර්ථ්‍යය හා විශ්වාසවත් භාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් (393 වෙනි අධිකාරය වන) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වෙනි වගන්තියේ විධිවිධානවලට අනුකූල ව, එකී නිල ඒනියාස් ද සිල්වා විජේසේකර මහත්මයා වන ඔබ පහත දක්වෙන කරුණු පිළිබඳ ව පරීක්ෂා කිරීමේ හා වාර්තා කිරීමේ කාර්‍ය්‍යයන් සඳහා මගේ කොමසාරිස්වරයා වශයෙන් ක්‍රියා කිරීමට ද ඔබ විසින් පරීක්ෂා කරනු ලබන කරුණු සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට ද මේ ප්‍රදාන පත්‍ර මගින් පත් කරමි. ඒ කරුණු නම් :—

(1) 1965 දෙසැම්බර මස හත් වැනි දින හෝ එදින පමණ පේරාදෙණියේ ලංකා විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ගෙන් කොටසක් වර්ජනයෙහි යෙදීමට තුඩු දුන් හේතු ;

(2) 1965 දෙසැම්බර 11 වෙනි දින විශ්ව විද්‍යාල බලධරයන් විසින් පොලිසියේ සහාය ලබාගැනීමට හේතු වූ සිද්ධීන් හා දේවල් ;

(3) ඉහත කී වර්ජනය පේරාදෙණියේ ලංකා විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ගෙන් පිටස්තර යම් තැනැත්තකු, තැනැත්තන් පිරිසක් හෝ යම් සංවිධානයක් විසින් පොළඹවනු ලැබී ද, උනන්දු කරවනු ලැබී ද නැතහොත් ඊට ධෛර්‍ය්‍ය දෙනු ලැබී ද යන වග ; සහ එසේ නම්, ඊට වග කිය යුත්තේ කවුරුන් ද යන වග සහ එය කරන ලද්දේ කුමන අරමුණක් සඳහා ද යන වග ;

(4) වර්ජනයට හෝ එය පවත්වාගෙන යෑමට අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් ම වග කිව යුතු, අයථා පාලනයක් හෝ යුතුකම් පැහැර හැරීමක් පේරාදෙණියේ ලංකා විශ්ව විද්‍යාලයේ පාලනයෙහි වගකීම දරන බලධරයන් අතින් සිදුවූයේ ද යන වග ;

(5) අනාගතයේ දී එවැනි සිදුවීම් ඇතිවීම වැළැක්වීමේ ප්‍රතිකර්ම වශයෙන් කුමන දේවල් කළ යුතු ද යන වග ; සහ

(6) ඔබ වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ඉහත නිශ්චිත ව සඳහන් කරුණුවලට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ වෙන යම් කරුණක්.

පූර්වෝක්ත කරුණු හා වෙනත් සමාන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ය යි ඔබට පෙනී යා හැකි සියලු පරීක්ෂණ පවත්වන ලෙසත්, සියලු විමර්ශන කරන ලෙසත්, එකී කොමසාරිස් වන ඔබට මෙයින් බලය පවරා ඔබ පත් කරන අතර, ඒ සම්බන්ධයෙන් වාර්තාවක් 1966 ජනවාරි මස දහහත් වැනි දිනට පෙර ඔබගේ අත්සනින් මා වෙත එවන ලෙස ඔබට මෙයින් නියම කරමි.

පරීක්ෂණය රහස්‍ය ලෙස පැවැත්වීම ඔබ විසින් අවශ්‍ය ය යි හෝ ප්‍රඥාගෝචරය යි සලකනු ලබන අවස්ථාවක හැර, එය ප්‍රසිද්ධියේ පැවැත්විය යුතු යයි මම මෙයින් විධාන කරමි.

තවද ඔබේ පරීක්ෂණ වල හා විමර්ශනවල කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියලු රජයේ නිලධාරීන් විසින් හා වෙනත් තැනැත්තන් විසින් ඒ සඳහා නිසි පරිදි දිය හැකි සියලු සහාය දිය යුතු යයි ද සැපයිය යුතු සියලු තොරතුරු සැපයිය යුතු යයි ද මම මෙයින් නියම කර විධාන කරමි.

මේ දිවයිනෙහි මුද්‍රාව යටතේ එක්වා දහස් නවසිය හැට පහේ දෙසැම්බර මස දහහත් වෙනි දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,
ඇල්. ඩී. එච්. ද සිල්වා,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම් වෙනුවට.


ලංකාවේ වැලව්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.

1801——ආර් 10896—9,350 (65/12)